**මාතර ප්‍රාදේශීය සභාව,**
**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.244,957 ක ව්‍යාපාර බදු හා දැන්වීම් පුවරු ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ගොඩනැඟිලි සංවර්ධනය කිරීම වෙනුවෙන් වැය කළ රු.3,030,132 ක් ප්‍රාග්ධනික කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ගම්පෙරළිය වැඩ සටහන යටතේ ඉටු කල කර්මාන්ත 04 ක හා සභා අරමුදලේ ඉටු කරන ලද කර්මාන්ත දෙකකට අදාලව රු.1,540,062 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.1,873,761ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 204,604 ක් වූ ගිණුම් විෂයයකට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂඅතර, අසමනතා එකතුව රු.30,000 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | එකතුව සටහන් කිරීමේදී වූ දෝෂයක් බැවින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.292,195,661 ක් වූ ගිණුම් විෂයයන් 34 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | විධිමත් පරිදි යාවත්කාලීන කර ලේඛණ පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා දුනිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව හා දේපළ තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව හා දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කරමින් පවති. |

| | | | |
|---|---|---|---|
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි සකස් කර ඉදිරිපත් කරමි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවට අයත් වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) ප්‍රධාන ලේකම්ගේ 2018 මැයි 22 දිනැති අංක CSS/03/12/05 දරණ චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර තිබූ වාහනය සම්බන්ධයෙන් කටයුතු කර නොතබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල කටයුතු ඉදිරියට කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,861,639 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 29,052,831 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,538,000 | 9,525,622 | 9,109,358 | 8,178,917 | 5,490,330 | 6,288,696 | 4,257,985 | 7,762,653 |
| කුලී | 3,005,100 | 2,275,089 | 1,991,819 | 683,083 | 2,053,100 | 2,279,621 | 2,238,743 | 399,813 |
| බලපත්‍ර ගාස්තු | 2,245,100 | 4,824,766 | 4,815,916 | 8,850 | 1,195,100 | 3,189,741 | 3,189,741 | - |
| වෙනත් ආදායම් | 35,642,500 | 19,336.538 | 31,428,738 | 44,687,936 | 21,173,700 | 22,058,212 | 29,565,277 | 56,780,136 |
| **එකතුව** | 47,430,700 | 35,962,015 | 47,345,831 | 53,558,786 | 29,912,230 | 33,816,270 | 39,251,746 | 64,942,602 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.7,746,244 ක් වූ අතර, රු.4,922,809 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.12,669,054 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.4,509,396 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.8,159,658 ක හිඟ ශේෂයක් පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 36 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ජංගම සේවය හා ක්ෂේත්‍ර කටයුතු මගින් හිග වරිපනම් රැස් කිරීමට කටයුතු යොදා ඇත. |
| **(ආ) අක්කර බදු**<br>ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.16,409 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් (ගාස්තු හා දඩ සමග) රු.2,931 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.81 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.19,259 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ලේඛණයේ පවතින ලිපිනයන් සහ හිමිකරුවන් නිවැරදි ව යාවත්කාලීන කර ගැනීම සඳහා සමීක්ෂණයක් කර තොරතුරු නිවැරදි කර ගත යුතු බවට ආදායම් කමිටුව දන්වා ඇත. |

### 2.2.3 වෙනත් ආදායම්

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.7,724,570 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.36,963,366 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිග ආදායම් කඩනමින් අයකර ගැනීම කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම පරිසර අධිකාරිය විසින් කාබනික පොහොර නිෂ්පාදන සඳහා 2013 වර්ෂයෙන් පසුව පරිසර බලපත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මධ්‍යම පරිසර අධිකාරියට පරිසර බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති අතර පරිසර බලපත්‍ර ලබා දීමට මධ්‍යම පරිසර අධිකාරිය නිර්දේශ කර ඇත. |

## 3.2 කළමණාකරන අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ස්වර්ණපුර පොදු ළිඳ ඉදිකිරීමේදී ශක්‍යතා වාර්තාවක් සහ පානීය ජල අවශ්‍යතාවය සඳහා සුදුසු බවට තාක්ෂණික වාර්තාවක් ද ලබා නොගෙන සහා අරමුදලින් රු.415,814 ක වියදම් දරා ළිඳ සකස් කර තිබුණු නමුත් ළිඳෙහි ජලය භාවිතයට ගැනීමට නුසුදුසු තත්ත්වයේ පැවතුණි. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් වියදම අය කළ යුතුවේ. | ලවණ සහිත ජලය අන්තර්ගතවී ඇති බැවින් එය වැලැක්වීමට ජලරෝදක සිමෙන්ති භාවිතයෙන් ප්‍රතිසංස්කරණය කර ඇත. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි වෙනුවෙන් සකස් කරන ලද රු.38,040ක් වටිනා නාම පුවරු 04 ක් සවි නොකර ගබඩාවේ ගබඩාකර තිබූ අතර රු.89,475 ක් වටිනා දැන්වීම් පුවරු 08 ක් සවිකරන ලද ස්ථානවල නොතිබුණි. | දැන්වීම් පුවරු අදාල ස්ථානවල කඩිනමින් ස්ථාපිත කළ යුතුවේ. | දැනට එම පුවරු 4 ඉඩම්වල සවි කිරිමට කටයුතු කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>පුරප්පාඩු 09 ක් සම්පූර්ණ කර ගැනීමට හා 09 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | 2020 පෙබරවාරි 07 දින ගැසට් පත්‍රයේ තනතුරු පුරප්පාඩු පල කර තිබුණද බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් සෞඛ්‍ය කම්කරුවන් 06 දෙනෙකුට හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 03 දෙනෙකුට නියමිත රාජකාරි පැවරීමක් සිදු කර නොතිබීම හේතුවෙන් අදාල රාජකාරි ඉටුකර ගැනීම සඳහා අනියම් පදනම මත නැවත සේවකයින් 03 දෙනෙකු ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදයට රු.507,680 ක් ගෙවා තිබුණි. | නියමිත පරිදි රාජකාරි පැවරීමක් සිදු කළයුතු අතර දෛනික රාජකාරි පැවරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කළ යුතුවේ. | අවශ්‍යතාව මත සිදුකර ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | යක්දූව කොම්පෝස්ට් අංගනය පිහිටි ඉඩම පිටුපස බිම් කොටසේ කෝමාරිකා වගාව සඳහා බිම් සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී රු.360,885 ක වියදමක් දරා තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා භාවිතා කල යුතුවේ. | කෝමාරිකා වගාව අසාර්ථක වූ නිසා පැල වලට මුදල් ගෙවීම නතර කරමි. |
| (ආ) | කහටගහවත්ත ගෝල්ඩන් සිටි ඉඩම අනුබෙදුම් කිරිමේදී පොදු පහසුකම් සඳහා පර්චස් 6.15 ක ඉඩම් ප්‍රමාණයක් අඩුවෙන් ලබාගෙන තිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කලයුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (ඇ) වගන්තිය ප්‍රකාර වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ ආයතන 10 ක පරිසර බලපත්‍ර යාවත්කාලීන කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සඳහන් කර ඇති ආයතන සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රූඩ් 03 පර්චස් 35.48 ක් වූ ඉඩම් 07 ක පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් පදිංචිව දේපල භුක්තිවිදිමින් පැවතුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුවේ. | අනවසර ඉඩම් භාවිතා කිරිම සම්බන්ධයෙන් නිතිමය කටයුතු සිදු කරමි. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයට අයත් පර්චස් 35 ක් වූ ඉඩම් 02 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

### 3.5.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ඉඩම් හා ගොඩනැඟිලි | | |
| | සභාව සතු අක්කර 12 රූඩ් 03 පර්චස් 1.81 ක් වූ ඉඩම් 38 ක් සහ සභාව සතු හුංගම්ගොඩ තොටුපොල පාරු සේවය ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගත යුතුවේ. | හුංගම්ගොඩ තොටුපල පාරු සේවය කැඩී අකර්මන්‍යව පවතින නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත. එම පාරු සේවය නැවත නවීකරණය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | මෝටර් රථ හා කරත්ත | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු වටිනාකම රු.5,600,000 ක් වූ වාහන 04 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යොදා ගත යුතුවේ. | වාහන 02 ක් වෙන්දේසි කිරීමට කටයුතු ඇති අතර, වාහන 02 ක් රියදුරු කෙනෙකු නොමැති නිසා ගාල් කර ඇත. |

## 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි සඳහා නාම පුවරු සකස් කිරීම වෙනුවෙන් එක්තරා ග්‍රාම සංවර්ධන සමිතියකට සමාලෝචිත වර්ෂයේදී රු.776,466 ක් ගෙවා තිබුණද නියමිත පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම නිසා දැන්වීම් පුවරු 02 ක් සවි කිරීම සඳහා රු.213,070 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම නැවත අය කල යුතුවේ. | ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට වගබලා ගනිමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාළ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කිරිමට ඉදිරියේදී කටයුතු කරමි. |